# ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතික පුනර්ජීවන ව්‍යාපාරය පසුබිම් කොට අනගාරික ධර්මපාලගේ දර්ශනය තුළින් ඉස්මතු වන සිංහල බෞද්ධ කුලකාන්තාව පිළිබඳ සංකල්පය

**ආචාර්ය එම්. ශ්‍රියානි ගුණරත්න**[1]

*[1]ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය පේරාදෙණිය, ශ්‍රී ලංකා.*
**msgunarathne@yahoo.com*

බ්‍රිතාන්‍ය ආධිපත්‍ය යටතේ ශීඝ්‍රයෙන් සිදුවෙමින් පැවති බටහිරකරණය හා ක්‍රිස්තියානිකරණයට ප්‍රතික්‍රියාවක් ලෙස දහනවවන සියවසේ මැද වනවිට, දේශීය ආගම් හා සංස්කෘතීන් නැවත නගා සිටුවීමේ ව්‍යාපාර ආරම්භ විය. බෞද්ධාගම ආරක්ෂා කිරීමේ ව්‍යාපාරයක් ලෙස පහතරට ප්‍රදේශවල ආරම්භවන බෞද්ධ සංස්කෘතික පුනර්ජීවන ව්‍යාපාරය, යටත්විජිත සමාජ ආර්ථික ක්‍රමය තුළ මතුවන දේශීය ධනවතුන් ඇතමෙකුගේ අනුග්‍රහය හා නායකත්වය මත පුළුල් පදනමක් තුළ විවිධ පැති ඔස්සේ විහිදී ගියේය. මෙම පවුලකට අයත් ධර්මපාල දේශීය ආගමික හා සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීමේ හා ප්‍රතිෂ්ඨාපනය කිරීමේ නව දර්ශනයක් මත දහනවවන සියවසේ අවසාන දශක වනවිට මෙම ව්‍යාපාරයට ශක්තිමත් නායකත්වයක් ලබා දුන්නේය. දේශන, පුවත්පත් සඟරා, විවෘත විවාද, යනාදී ප්‍රචාරක අවි උපයෝගී කරගෙන, ගෙනෙන ඔහුගේ දර්ශනය සිංහල බෞද්ධ සංස්කෘතික පුනර්ජීවන ව්‍යාපාරය තුළ කෙතරම් ජනප්‍රිය වූවාදයත්, ඔහුගේ අනුගාමිකයින් එය තවදුරටත් ප්‍රචාරය කිරීමට සහායවේ. ක්‍රිස්තියානි පිළිගැනීම් හා බටහිර අධ්‍යාපනය මත දේශීය සමාජය තුළ ස්ථාපිත කිරිමට උත්සාහ කළ වික්ටෝරියානු මධ්‍යම පාන්තික කාන්තාවගේ ප්‍රතිරූපයට ප්‍රතිඋත්තරයක් ලෙස සිංහල බෞද්ධ කාන්තාවගේ අනන්‍යතාව ගොඩනැගීමේ උත්සහය ධර්මපාලගේ දර්ශනය තුළින් මතුවේ. සාම්ප්‍රදායික සාහිත්‍යයේ එන කාන්තාව පිළිබඳ පිළිගැනීම් හා ආකල්ප මෙන්ම ඔහු ඇසුරු කළ සමකාලීන බෙංගාල සමාජයේ ආභාසයද ධර්මපාල ගොඩනැගීමට උත්සාහ කළ ආර්ය සිංහල බෞද්ධ කුල කාන්තා ප්‍රතිරූපය තුළ පෙනේ. සමකාලීන බටහිර සංස්කෘතිය හා බැඳී ගිය සමාජ ආර්ථික පරිවර්තනය ප්‍රතික්ෂේප කළ ද, ඉන් මුළුමනින්ම ගැලවී සිටීමට නොහැකි වූ ධර්මපාල දකින සිංහල බෞද්ධ කාන්තාව අවසානයේ මේ අදහස් සම්මිශ්‍රණයේ නිර්මිතයක් විය. මෙම පර්යේෂණය සඳහා ධර්මපාල විසින් රචිත විවිධ ලේඛන, පුනර්ජීවන ව්‍යාපාරය ආශ්‍රිත සාහිත්‍යය මෙන්ම තත්කාලීන පුවත්පත් හා සඟරා පාදක කරගනු ලබන අතර ඒ හැරුණු විට ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනය විසින් ගොඩනගන ලද නිල ලේඛන ඇතුලු ප්‍රාථමික මූලාශ්‍රය විශ්ලේෂණාත්මක අධ්‍යයනකට ලක් කරනු ලබයි.

මුඛ්‍ය පද ඃ බටහිරකරණය, ක්‍රිස්තියානිකරණය, සංස්කෘතික, යටත්විජිත, පුනර්ජීවන